මාතලේ මහා නගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) 2016 වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම හා ප්‍රාග්ධන ආධාර පිළිවෙලින් රු.1,906,850කින් හා රු.3,429,255 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම රු.3,716,158 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) එකතු වටිනාකම රු.1,460,430 ක් වූ වාහන එකක හා යන්ත්‍ර දෙකක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබියයුතු විශ්‍රාමගිය/සේවය අතහැරගිය නිලධාරීන් 134 දෙනෙකුගේ සේවක ණය ශේෂය වූ රු.945,301ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වුණි.

(ඉ) නාගරික සංවර්ධන ඒකාබද්ධ ගිණුමේ ශේෂය රු.1,392,000 කින් අඩුවෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.213,108,106 වූ ගිණුම් විෂයයන් 4 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.10,399,611 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 12 ක එකතුව රු.70,122,861 ක්වූ අතර, එහි වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.4,143,208 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක වටිනාකම රු.144,257,421 ක්වූ අතර, එහි වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.94,435,014 ක් වූ ශේෂ ද ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 7කට අදාල එකතුව රු.57,664,115ක් ක්වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 571 | රු.1,206,522 ක් වූ කර්මාන්ත 10 කට අදාළ කල් ඉකුත් රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ii) මු.රෙ.751,756,757(2) | මහා නගර සභාවේ ස්ථාවර වත්කම් පිළිබඳව ලේඛන පවත්වාගෙන යාම සහ ඒවා පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නියම කර ඇති ආකෘති වලින් යුක්තව වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,092,890 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,024,503 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.22,068,387 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ආදායම් ප්‍රභවයන් 3ක රු. 28,474,792 ක ආදායම් වැඩිවීම හා වියදම් විෂයයන් 2ක රු.7,207,421ක වියදම් අඩුවීම විශේෂයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
-------------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය
------------------------------------------

2009 වර්ෂයේ ටෙන්ඩර් කර ලබාදී තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීමේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව 2014 වර්ෂය අවසාන වනවිට අයවිය යුතු රු.4,396,394ක එක්වන් මුදල අය නොවීම මත සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවියයුතු රු.11,310,092 ක් වූ සියයට 10 ක මාසික දඩ ගාස්තුව අයකරගෙන නොතිබුණි.

2.3.2 වරිපනම්
-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.23,718,426 ක් විය.

2.3.3 වෙනත් ආදායම්
-------------------

(අ) ජල ගාස්තු
------------

මහා නගර සභාව විසින් පවත්වාගෙන යන ලද ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේදී ජාතික ජල සම්පත් මණ්ඩලයට පවරන අවස්ථාව වන විට අයවීමට තිබුණු රු.4,802,812ක හිඟහිටි ජල ගාස්තු ශේෂය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) කුලී ආදායම්
----------------

2016 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී ශේෂය රු.3,088,591 ක් විය.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් වශයෙන් රු.205,500ක් හා මුද්දර ගාස්තු රු.38,504,300 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර
---------
මහා නගර සභා ආඥා පනත (252 වන අධිකාරය) යටතේ ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර වලට අදාලව රු.96,851 ක මුදලක් අයවියයුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දිගු කාලයක සිට පැවත එන රු.8,699,455ක හඳුනානොගත් ණයහිමි ශේෂයක් නිරවුල්කර නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් බදු දීමේදී හෝ බැහැරට දීමේදී මහා නගර සභා ආඥා පනතේ 36(i) (iii) හා 40(i) ඊ වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබාගතයුතු වුවද, මාතලේ එම්.සී. පාරේ පිහිටි හිස් ඉඩම් කැබලි 103 ක, විජය මාවතේ ඉඩම් කැබැලි 16 ක හා හිග්ගොල්ල සැක්ෂන් පාර්ක්හි අක්කර 2 යි පර්චස් 14 ක ප්‍රමාණයන්හි අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මාතලේ මහා නගර සභාවට අයත්ව තිබූ දියබුබුල ඉඩම නව පොලිස් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට 2005 වර්ෂයේදී පොලිසියට පවරා දී තිබූ අතර, ඒ වෙනුවට රථගාලක් හා වාණිජ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට නගර සභාවට ලබාදීමට එකඟ වී තිබූ පැරණි පොලිසිය පිහිටා ඇති ඉඩම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවරාගෙන නොතිබුණි.

(ඈ) ගොංගාවෙල බස්නැවතුම්පලට යාබද පර්චස් 15.8 ක ඉඩමෙහි පිහිටි ගොඩනැගිල්ල, කියවීම් ශාලාවක් හා පුස්තකාලයක් පවත්වාගෙන යාමට 1970 සිට බදු දී තිබූ අතර, වසර 5 කට වරක් තක්සේරුවක් සිදුනොකර 2003 වර්ෂයේ කළ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයට ද බදුකුලී අයකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 23 ක පැවැති පුරප්පාඩු 59 ක් සඳහා විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, කර්මාන්ත හා සෞඛ්‍ය කම්කරු පත්වීම් දරන අතිරික්ත සේවකයින් 30 දෙනෙක් අදාල රාජකාරියෙහි නොයොදවා කාර්යාලීය ලිපි කටයුතු, පරිගණක කටයුතු හා වෙනත් තනතුරුවල සේවයේ යොදවාගෙන තිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය හා පොදු අරමුදල් මඟින් රු.119,230,940 ක් වැයකර ඉදිකර තිබූ මහල් 4 කින් සමන්විත සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහල මහල් දෙකෙහි කඩ කාමර වෙන්වන පරිදි ඉදිකිරීම් කර නොතිබුණු බැවින් එම මහල් දෙක නිෂ්කාර්යයව පැවතුණි. මෙම කර්මාන්තය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් වාරික මුදල් හා පොලී ලෙස රු.11,414,245 ක් වාර්ෂිකව දරන නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, ගොඩනැගිල්ලෙන් උපයන වාර්ෂික බදුකුලී ආදායම රු.8,049,215ක්ව පැවතුණි.

(ආ) නගරයේ කුකුල් මස් වෙළඳාමෙහි නියුතු කඩහිමියන්ගෙන් ලද රු.645,000ක් හා සභා අරමුදලින් රු.151,500 ක් ලෙස එකතුව රු.796,500ක් වැයකර 2012 වර්ෂයේදී සභාවට අයත් භූමියක ඉදිකර තිබූ ඝන මීටර 44ක ධාරිතාවයකින් යුතු ජීවවායු ඒකකය හා විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ රු.3,200,000ක ප්‍රතිපාදන මත 2015 දෙසැම්බර් වනවිට ඉදිකර දී තිබූ ඝන මීටර 50ක ධාරිතාවයෙන් යුත් ජීවවායු ඒකකය නිෂ්කාර්යව පැවතුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

මාතලේ මහා නගර සභාවට අයත් වාහන අංගනය නවීකරණය කිරීම.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රු.10,000,000ක් හා ඉතිරි මුදල සභා අරමුදලින් දැරීමේ එකඟත්වය මත යථෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණයකර තිබූ අතර, ඒ සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව කර්මාන්තය ඉටුකර ගැනීමට අපොහොසත්වීම හා සභා අරමුදලින් මුදල් නොයෙදීම හේතුවෙන් රු.13,706,250ක ගිවිසුම්ගත මුදලින් රු.4,022,722ක එනම් සියයට 29 ක වැඩ කොටසක් පමණක් නිමකර කර්මාන්තය නවතා තිබුණි. ඒ හේතුවෙන් අනුමතව තිබූ රු.5,977,278ක ප්‍රතිපාදන මුදලක් උපයෝජනය කරගැනීමටද අපොහොසත්වී තිබූ අතර, අඩක් නිමකල ගොඩනැගිල්ල 2017 ජූනි 30 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම
------------------------
සමාලෝචිත වර්ෂයේදී සහා පොදු අරමුදල් මඟින් ඉටුකිරීමට ප්‍රතිපාදන අනුමත වී තිබූ රු.1,324,794 ක් වූ කර්මාන්ත 9 ක් ඉටුකර නොතිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) UNESCAP ආයතනයේ ප්‍රතිපාදන මත රු.4,500,000 ක් වැයකර ඉදිකර තිබූ ඩෝල පාරේ කොම්පෝස්ට් අංගනය සහ ඊට අයත් උපාංග හා උපකරණ 43ක් 2015 මාර්තු සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) කසල බැහැර කරනු ලබන වාරියපොලවත්ත පෞද්ගලික ඉඩම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ විරෝධතා හේතුවෙන් සභාවට හා මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර, නඩු ගාස්තු වශයෙන් රු.3,336,215 ක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ) දැනට කසල බැහැර කරන ඉඩම සම්බන්ධ ගැටළුවට විසඳුමක් වශයෙන් කසල බැහැර කිරීම සඳහා 2010 වර්ෂය තුල රු.2,000,000 ක් වැයකර නව ඉඩමක් මිලදීගෙන තිබෙන නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී ඉඩමට විධිමත්ව කසල බැහැරකිරීමේ ක්‍රමවේදයක් ආරම්භ නොකිරීම හේතුවෙන් ඉඩම නිෂ්කාර්යව පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------
සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුවද අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ අතර වැය ශීර්ෂ 8 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා 1,952,308 ක්වූ වියදම් දරා ඇතත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------
මහා නගර සභා අභ්‍යන්තර විගණන අංශය සඳහා එක් නිලධාරියෙකු පමණක් අනුයුක්තව සිටි අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්ම පරිදි විගණන කටයුතු සිදුකර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය.

(ආ) වත්කම් පාලනය.

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය.

(ඈ) අයවැය පාලනය.